## ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් - 2015/2016

---

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්හි 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ ප්‍රකාශනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම්, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියුතු වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් මඟින් මා වෙත සහාය දක්වන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

### 1.2 සමාගම සංස්ථාපනය කිරීම හා එහි අයිතිය

---

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්, නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් හා නැන්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ඒකාබද්ධ කිරීම මඟින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සීමාසහිත සමාගමකි. මෙම සමාගම ශ්‍රී ලංකා රජය හා ප්‍රමුඛ පෞද්ගලික අංශයේ සමාගම් හයක් අතර වන රජයේ හා පෞද්ගලික අංශයේ හවුල් ව්‍යාපාරයක් ලෙස සංස්ථාපනය කරන ලදී.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“මණ්ඩලයේ”) වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය වන පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 මාර්තු 31 දිනට ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍යම පරිමාණ අස්තිත්වයන් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**කරුණු අවධාරණය කිරීම**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දිගින් දිගටම පවතීය යන උපකල්පනය මත, මාගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල 28 වන සටහන වෙත මාගේ අවධානය යොමු කරමි.

**වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් අනුව වාර්තා කිරීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මඟින් අවශ්‍ය වන පරිදි, පහත කරුණු දක්වමි,

(අ) විගණනයෙහි මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමාවන් ඉහත දක්වන පරිදි වේ.

(ආ) මාගේ මතය අනුව විගණනය සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන පරිදි, සමාගම විසින් ක්‍රමවත්ව ගිණුම් වාර්තා පවත්වාගෙන ඇති අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවය හා අනුකූල වේ.

කෙසේ වෙතත්, සමාගමේ ශුද්ධ වත්කම් දක්වන ලද ප්‍රාග්ධනයෙන් භාගයකටත් වඩා අඩු වන අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තිය ප්‍රකාරව ප්‍රාග්ධන තත්ත්වයෙහි තදබල පාඩුවකට මුහුණ පා ඇති බව මෙහිදී සඳහන් කළ යුතුය. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා සමාගම විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය මූල්‍ය ප්‍රකාශනවල 29 වන සටහන පැහැදිලි කරයි.

**2.3** **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| (i) 6.3.1 වගන්තිය | සමාගම විසින් එක් එක් ඉකුත් වර්ෂය සඳහා වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණු අතර පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (ii) 9.2 (ඉ) වගන්තිය | සමාගමේ සංවිධාන සටහන හා කාර්ය මණ්ඩලය සඳහා පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | 9.3.1 (i) වගන්තිය | සමාගමේ බඳවා ගැනීමේ හා උසස්වීම් ලබාදීමේ පරිපාටිය (SOR) ඒ හා සම්බන්ධ අමාත්‍යාංශය මඟින් මහා භාණ්ඩාගාරයෙහි පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සමගාමීත්වයෙන් අනුමත කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වල ප්‍රතිඵලය රු.144,708,235 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු.229,105,780 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.84,397,545 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෙළඳ ලැබිය යුතු ණය හානිකරණය සඳහා වන අවශ්‍යතාවය හීන වීම මෙම සුළු වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, සමාගම සමුච්චිත අලාභයක් අත්දකින අතර මෙම සමුච්චිත අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.170,030,439 කින් වර්ධනය විය.

### 3.2 සමාගමෙහි අගය එකතු කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011/2012 වර්ෂයේ සිට 2015/2016 වර්ෂය දක්වා ශුද්ධ අලාභය අඛණ්ඩව පැවතුණි. කෙසේ වෙතත්, සේවක පාරිශ්‍රමික, රජයට ගෙවන ලද බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී, 2014/2015 වර්ෂයේදී හැර අනෙකුත් වර්ෂවලදී සමාගමේ සමස්ත දායකත්වය අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

--------------------------------

ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබූ නමුත්, පෞද්ගලික පාර්ශවයන්ගේ අරමුදල් උපයෝජනය මඟින් ව්‍යාපෘති සිදු කිරීම සඳහා අපේක්ෂිත ඉලක්ක හා වෙන් කරන ලද මුදල් ඊට ඇතුළත් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.ෙ

| පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) තොග වාර්තා කළමනාකරණය | - විධිමත් පරීක්ෂාවන් සිදුකර ඇති බවට හා තොග වාර්තා ලැබෙන කාල සීමාව වන විට ප්‍රමිති පරීක්ෂාවන් සිදු කරන බවට හා ප්‍රමාණවත් පරිදි ලිපිගොනු පවත්වාගෙන යන බවට හා සහතික කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් සමාගම විසින් ඇති කර නොතිබුණි. |
| | - තොග වාර්තා වියැයීම පිළිබඳව වාර්තාවක් සැපයීමට තොග වාර්තා කළමනාකරණ පද්ධතිය අසමත් වී තිබුණි. |
| (ආ) ලැබිය යුතු ණය | - මෙම පද්ධතිය මඟින් සපයන ලද කාල විශ්ලේෂණය දින 90 ට වැඩි ණයගැතියන් විශ්ලේෂණය නොකරයි. |
| (ඇ) ස්ථාවර වත්කම් කළමනාකරණය | - ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන වත්කම් වලට අදාළව පවතින තොරතුරු අදාළ වත්කම් වල තොරතුරු හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් නොවීම. |
| | - 2014 න් පසු ස්ථාවර වත්කම් වල විස්තරාත්මක භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. |